**නාවලපිටිය නගර සභාව**
**මහනුවර දිස්ත්‍රික්කය**
**-------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 27 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජුනි 20 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය.

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට නාවලපිටිය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ලැබියයුතු ගිණුම්

2015 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු ගිණුම් ශේෂ 04ක වටිනාකම රු.27,369,710ක් වූ අතර, එයින් වසර 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.26,007,513ක් වී තිබුණි.

#### 1.3.2 ගෙවිය යුතු ගිණුම්

2015 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 03ක වටිනාකම රු.15,190,558 ක් වූ අතර, එයින් වසර 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.13,321,641ක් විය.

#### 1.3.3 නීති රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය කරනු ලැබේ.

| | නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ). | ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4වන වගන්තිය | විශ්‍රාමික සේවකයින් 13කගෙන් අයවිය යුතු රු.111,312ක් හා සේවය හැරගිය සේවකයින් 16කගෙන් අයවිය යුතු රු.319,488ක් අයකරගෙන නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි. | |
| | 571 (3) | අවස්ථා 14කට අදාළ රු.119,705ක් වටිනා කල් ඉකුත් වූ තැන්පතු නියාදනය කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව,2015දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.14,165,013ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,801,779ක් වුයෙන්, මූල්‍ය ප්‍රතිඵලයේ රු.8,363,234ක වර්ධනයක් දක්නට ලැබුණි.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස් කිරීමේ කාර්යය සාධනය

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂය | 2015.01.01 දිනට හිඟය | 2015.12.31 දිනට හිඟයෙන් අයකිරීම | 2015 වර්ෂයේ බිල්කිරීම් රු. | වර්ෂයේබිල්කිරීම් වලින් අයවීම රු. | මුළු හිඟය රු. |
|---|---|---|---|---|---|
| වරිපනම් හා බදු | 12,670,524 | 3,521,808 | 13,013,291 | 8,707,218 | 13,454,789 |
| කුලී | 4,569,920 | 3,028,510 | 13,702,371 | 12,627,787 | 2,615,994 |
| වෙනත් | 871,782 | 49,300 | 156,300 | 63,000 | 915,782 |
| එකතුව | | | | | 16,986,565 |

සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.16,986,565 ක මුළු ආදායම් ශේෂයක් හිඟ හිට පැවතිණි.

#### 2.2.2 වරිපනම් බදු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වර්ෂය තුලදී හිඟ මුදලින් අයකිරීම් රු.3,521,808 ක් හෙවත් සියයට 27ක් විය.

(ආ) බිල් කිරීම්වලින් අයකිරීම රු.8,707,218ක් හෙවත් සියයට 66ක් විය.

(ඇ) සභාවේ දේපළ වර්ෂ 05කට වරක් තක්සේරුකර ඒ අනුව වරිපනම් බදු සංශෝධනය කළ යුතු වුවද, 2009 වර්ෂයේ තක්සේරුවට අනුව 2015 වර්ෂයේදීද බදු අයකර තිබුණි. 2009 වර්ෂයෙන් පසුව නාවලපිටිය නගරය සීඝ්‍රයෙන් සංවර්ධනය වී ඇති බැවින් 2015වර්ෂයේදී වරිපනම් බදු සංශෝධනය නොකිරීම නිසා සභාවට සැළකිය යුතු ආදායමක් අහිමිවී තිබුණි.

**2.2.3 වෙනත් ආදායම්**

----------------

**(අ) මස්කඩ බදුදීම**

----------------

සභාව සතු ගව මස්කඩ දෙකක් හා එළු මස් කඩය 2015 වර්ෂයට බදුදීමේදී, සාධාරණ හේතුවකින් තොරව 2014 පිළිගත් ටෙන්ඩර් මුදලට වඩා අවම ලංසු මුදල රු.3,300,000කින් අඩුකිරීම නිසා සභාවට අවම වශයෙන් රු.3,300,000ක පාඩුවක් සිදුවී තිබුණි.

**(ආ) වැසිකිළි බදුදීම.**

------------------

සුපිරි වෙළඳ සංකීර්ණයේ ඇති පොදු වැසිකිළි පද්ධතිය සුපිරි වෙළඳ සංකීර්ණ ව්‍යාපාරික සංගමයට බදුදී තිබූ අතර 2015 අගෝස්තු මස සිට දෙසැම්බර් 31 දින දක්වා අයවිය යුතු රු.75,145ක මුදලක් 2016 මාර්තු 08වන දිනය වන විටත් අයකරගෙන නොතිබුණි.

**(ඇ) රථ වාහන නැවතුම් ගාස්තු.**

------------------------------

(i) ත්‍රී රෝද රථ

--------------

සභා බල ප්‍රදේශයේ ත්‍රී රෝද රථ නැවතුම් ස්ථාන 18ක ත්‍රී රෝද රථ 600කට අධික ප්‍රමාණයක් ලියාපදිංචි කර තිබූ අතර 2015 දෙසැම්බර් 31 දිනට රු.1,070,442ක ගාස්තුවක් අයකරගෙන නොතිබුණි.

(ii) වෑන් රථ

-----------

නගරයේ වෑන් රථ නැවතුම් ස්ථාන 04ක වෑන් රථ 40කට ආසන්න ප්‍රමාණයක් මාස 06කට වඩා ගාස්තු ගෙවීම් පැහැර හැර ඇති අතර, 2015 දෙසැම්බර් 31 දින වන විට රු.528,849ක ගාස්තුවක් අයකර ගත යුතුව පැවතුණි.

(iii) ලොරි රථ

-----------

ලොරි රථ නැවතුම් ස්ථාන 04කින් ලියාපදිංචි වී තිබූ රථ 32න් රථ 22ක් මාස 03කට වැඩි කාලයක් ගෙවීම් පැහැර හැර ඇති අතර 2015 දෙසැම්බර් 31 දිනට රු.157,964ක හිඟයක් පැවතුණි. එම හිඟ ආදායම් අයකර ගැනීම සඳහා නගර සභා ආඥාපනතේ 170 (අ) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඈ) ජයතිලක ක්‍රීඩාංගනයේ අවන්හල බදුදීම

--------------------------------------------

ටෙන්ඩර් පරිපාටිය අනුගමනය නොකර හා ගිවිසුමකට බැඳීමකින් තොරව 2012-2015 දක්වා ක්‍රීඩා සමාජයකට ලබාදී තිබූ අතර 2015 දෙසැම්බර් 31 දිනට රු.222,310ක හිඟයක් පැවතුණි.

(ඉ) විනෝද බදු

-------------

නාවලපිටිය නගරයේ ඇති සිනමාහල් 02ක නිකුත් කළ හා නිකුත් කිරීමට තිබූ ප්‍රවේශ පත්‍ර මුද්‍රාතබා නොතිබූ බව සෝදිසි පරීක්ෂාවේදී අනාවරණය වූ අතර, සභාව විනෝද බදු අයකර ගැනීමේදී කිසිදු අධීක්ෂණයක් සිදුකර නොතිබුණි.

(ඊ) ඉඩම් බදුකුලී

----------------

සභාවට අයත් ඉඩම් බදුදීම්වලින් අයවිය යුතුව ඇති රු.360,581ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර මෙම බදුකුලී මාස 06ට වඩා හිඟව පැවැතුණි.

(උ) ජල ගාස්තු

------------

2015 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ජල ගාස්තු වටිනාකම රු.914,482ක් වූ අතර මෙයින් රු.752,492ක මුදලක් වසර 03කට වැඩි කාලයක සිට පාරිභෝගිකයින් 40 දෙනෙකු සම්බන්ධයෙන් කළ වැරදි බිල්කිරීම් නිසා අය නොවන බව නිරීක්ෂණය විය.

**2.2.4 බදු කුලී**

--------

සභාව සතු කඩ කාමර බදුදීම තුළින් සභාවට අයවිය යුතු රු.2,210,726ක මුදලක් 2015 දෙසැම්බර් 31 දිනට හිඟව පැවැතුණු අතර හිඟ කඩකුලී අයකර ගැනීමට ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

2015 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.286,456ක් හා මුද්දර ගාස්තු රු.3,963,340ක් ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වර්ෂ 2011-2014 කාලයට අදාළව දේපළ ණය වෙනුවෙන් අයවීමට ඇති හිඟ පොළිය රු.522,855ක් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.

(ආ) පැරණි නගර සභා ගොඩනැගිල්ල පිහිටි ස්ථානයේ ඉදිකිරීමට යෝජිත නව වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ලේ මූලික කටයුතු වෙනුවෙන් මේ දක්වා රු.1,000,000ක වියදමක් දරා තිබුණද, 2016 අප්‍රේල් වන විටත් එම ව්‍යාපෘතියේ කටයුතු ආරම්භකර නොතිබුණි.

(ඇ) සභා දේපළ දීර්ඝකාලීනව බදුදීමට නගර සභා ආඥාපනතේ 36 (ඉ) II වගන්තිය ප්‍රකාරව විෂයභාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබාගෙන ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කර බදුකරුවන් තෝරාගත යුතු වුවත්, විෂයභාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබා නොගෙන සභා තීරණ මඟින් සභා පොහොර අලෙවි සැල හා කිරිහල නිශ්චිත කාලසීමාවක් නොදක්වා දීර්ඝකාලීනව බදු දී තිබුණි.

**3.2 අවිධිමත් ගනුදෙනු**

-------------------

2015 පෙබරවාරි 11 දින අමාත්‍ය මණ්ඩල තීරණය අනුව රාජ්‍ය අරමුදල් යොදා ගනිමින් විදේශ සංචාරවල යෙදීම අත්හිටුවා තිබුණි, අදාළ ආයතනය සතු අරමුදල් ප්‍රාදේශීය ජනතාවගේ සුභ සිද්ධිය පිණිස යොදන ලෙසට දන්වා තිබියදී අවිධිමත් ලෙස සභාවේ මන්ත්‍රීවරු තිදෙනෙක් 2015 මැයි 08 දින සිට 13 දින දක්වා චීනයේ පැවැත්වූ කසළ කළමනාකරණය හා ආපදා කළමනාකරණය පිළිබඳ වැඩමුළුවකට සහභාගීවීම වෙනුවෙන් එක් අයෙකුට රු.160,000ක් බැගින් රු.480,000ක මුදලක් 2015 මැයි 12 දින සභා අරමුදලින් ගෙවා තිබුණි. 2015 මැයි 15 දින සභාව විසුරුවා හැර තිබීම නිසා දැරූ මුදලින් සභාවට ප්‍රතිලාභයක් ලබාගත නොහැකිව තිබුණි.

**4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

-------------------------------------

**4.1 සංයුක්ත සැළැස්ම**

--------------------

සමාලෝචිත වර්ෂයේ මාර්තු සිට ඉදිරියට සංයුක්ත සැළැස්මක් පිළියෙළ කර නොතිබුණි.

## 4.2 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛණයට අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 02ක සියයට 26 සිට සියයට 33 දක්වාද වියදම් විෂයයන් 05ක සියයට 21 සිට සියයට 68 දක්වාද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛණය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි.

## 4.3 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4:2 උප පරිච්ඡේද ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 4.4 අභ්‍යන්තර විගණනය

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි අංක 133 සහ 2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009/01 දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 4.5 වත්කම් කළමනාකරණය

### නිශ්ක්‍රීය වත්කම්

සභාව සතු රු.2,702,250ක් වටිනා වාහන 02ක් සහ පැරණි නගර සභා ගොඩනැගිල්ල වසර 02කට වැඩි කාලයක් තිස්සේ නිශ්කාර්යයව පැවතුණි.

## 5. පද්ධති හා පාලනය

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමණාකරණය